# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 32 දරන

# විදේශ විනිමය (සමා) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 අගෝස්තු මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1993 අගෝස්තු මස 13 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 32 දරන විදේශ විනිමය (සමා) පනත

[සහතිකය සටහන් කළේ 1993 අගෝස්තු මස 11 වන දින]

**එල්. ඩී.—ඕ. 96/92**

**හෙළි නොකරන ලද ලාභ සහ ආදායම් හෝ පිරිවැටුම් නියෝජනය කරන්නා වූ හෝ විනිමය පාලකයාට ප්‍රකාශ කරනු නොලැබුවා වූ හෝ, යම් විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවෙන් පිටත දරන්නා වූ ද, එම විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නා වූ හෝ ගෙන එන්නා වූ ද තැනැත්තන්ට බදු නීති සහ විනිමය පාලනයට අදාළ නීති ඔවුන් විසින් අනාගතයේ දී සම්පූර්ණයෙන් පිළිපදිනු ලැබීම පුරුක්ෂිත කිරීමේ අරමුණ ඇතිව, බදු අනුග්‍රහ සැලසීම සඳහා ද ; ඒ නීතිවලට අදාළ වැරදි සඳහා වූ නඩු පැවරීම්වලට එරෙහිව ඒ තැනැත්තන් හානි පූරණය කිරීම සඳහා ද : ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1993 අංක 32 දරන විදේශ විනිමය (සමා) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **කෙටි නාමය.**

2. (1) මේ පනත, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවෙන් පිටත යම් අදාළ විදේශ ව්‍යවහාර මුදලක් දරන්නා වූ ද— **මේ පනත අදාළ වන තැනැත්තෝ.**

(අ) (i) ඒ ව්‍යවහාර මුදල්, 1991 නොවැම්බර් මස 12 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1993 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර, වාණිජ බැංකුවක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නා වූ ; හෝ

(ii) ඒ ව්‍යවහාර මුදල්, 1991 නොවැම්බර් මස 12 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1993 මාර්තු මස 5 වන දින හෝ එදිනට පෙර, අනුමත ප්‍රවේශ වරායකින් නැතහොත් ගුවන් තොටුපළකින් ශ්‍රී ලංකාවට ඇතුළුවීමේ දී ශ්‍රී ලංකාවට ගෙන එන්නා වූ සහ ඒ ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් රේගු ආඥාපනත යටතේ ප්‍රකාශයක් කරන්නා වූ ; සහ

(ආ) එසේ ප්‍රේෂණය කරන ලද හෝ ගෙන එන ලද ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකාවේ යම් වාණිජ බැංකුවක තමන්ගේ නමින් විවෘත කරන ලද යම් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් තැන්පත් කරන්නා වූ

යම් තැනැත්තකුට අදාළ විය යුතු ය.

2—ඩී 026928—6,105 (93/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ

(2) මේ පනත —

(i) 1991 නොවැම්බර් මස 12 වන දින හෝ එදිනට පෙර තමාට ඇත තැගුන හෝ උපචිත වූ හෝ ව්‍යුත්පන්න වූ, අවස්ථෝචිත පරිදි, යම් ලාභ සහ ආදායම හෝ පිරිවැටුම සම්බන්ධයෙන් ආදායම් බදු පැනවීමට තත්කාලයෙහි අදාළ නීතිය හෝ 1963 අංක 11 දරන මුදල් පනත හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ ගෙවිය යුතු යම් බද්දක් ගෙවීම මගහරිනු ලැබුවේ යයි කියනු ලැබීමක් හෝ සැකකරනු ලැබීමක් ; හෝ

(ii) විනිමය පාලන පනතේ හෝ 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කළේ යයි කියනු ලැබීමක් හෝ සැක කරනු ලැබීමක්

පිළිබඳව යම් විමර්ශනයක්, 1991 නොවැම්බර් මස 12 වන දින නොනිමිව පවතින්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට, අදාළ නොවිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් නොවන, (1) වන උපවගන්තියේ සඳහන් සෑම තැනැත්තකු ම මේ පනතේ මින් මතු "මේ පනත අදාළ වන තැනැත්තකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

විශේෂයෙන් නිදහස් කිරීම.

3. මේ පනත අදාළ වන තැනැත්තකු—

(අ) පහත දැක්වෙන දේ ගෙවීමට යටත් නොවිය යුතු ය ; එනම්—

(i) පිළිවෙලින් ආදායම් බද්ද පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ හෝ ආදායම් බද්ද මත අධිභාරය පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ, 1992 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

(අ) 2(1) (ආ) වගන්තියේ සඳහන් යම් ගිණුමක, 1993 දෙසැම්බර් මස 31 වන දින ඔහුගේ බැරට ඇති මුදල ; සහ

(ආ) 2(1) (ආ) වගන්තියේ සඳහන් යම් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක ඔහු විසින් තැන්පත් කරන ලද අදාළ විදේශ ව්‍යවහාර මුදලින් 1993 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර ඔහු විසින් ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කරන ලද ඒ කොටස ; සහ

(ඇ) 2(1) (ආ) වගන්තියේ සඳහන් යම් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක ඔහු විසින් තැන්පත් කරන ලද අදාළ විදේශ ව්‍යවහාර මුදලින් 1993 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර විනිමය පාලකවරයාගේ ලිඛිත අනුමතය ඇතිව ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරන ලද ඒ කොටස

යන මුදල්වල එකතුවෙන් ඔහුගේ ලාභ සහ ආදායමේ නියෝජනය වන ඒ කොටස;

(ii) (i) වන අනුච්ඡේදයෙහි සඳහන් ඔහුගේ ලාභ සහ ආදායමේ කොටස යෙදවීම මගින් අත්කර ගන්නා ලද ඔහුගේ ශුද්ධ ධනයේ යම් කොටසක් වෙනුවෙන් ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ, 1992 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ගෙවිය යුතු වූ, පිළිවෙළින් යම් ධන බද්දක් හෝ ධන බද්ද මත වූ අධිභාරයක්; හෝ

(iii) (i) වන අනුච්ඡේදයෙහි සඳහන් ඔහුගේ ලාභ සහ ආදායමේ කොටස පැන නැගුනේ හෝ ව්‍යුත්පන්න වූයේ පිරිවැටුමක යම් කොටසකින් ද ඒ පිරිවැටුමේ කොටස වෙනුවෙන් 1991 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අවසාන වන යම් කාර්තුවක් සඳහා 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දක්; හෝ

(ආ) පහත දැක්වෙන යම් නීතියක් හෝ පනතක් යටතේ වූ යම් වරදක් සඳහා නඩු පැවරීමකට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය, එනම්—

(i) (අ) (i) වන ඡේදයෙහි සඳහන් ඔහුගේ ලාභ සහ ආදායමේ කොටස හෝ (අ) (ii) වන ඡේදයෙහි සඳහන් ඔහුගේ ශුද්ධ ධනයේ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන්, 1992 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයකට අදාළව ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට තත්කාලයෙහි අදාළ නීතිය; හෝ

(ii) (අ) (iii) වන ඡේදයෙහි සඳහන් ඔහුගේ පිරිවැටුමේ කොටස වෙනුවෙන්, 1991 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අවසාන වන යම් කාර්තුවකට අදාළව 1963 අංක 11 දරන මුදල් පනත හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත; හෝ

(iii) ඔහු විසින් කිසිම වාර වාර්තාවක් ඉදිරිපත් කර නොමැති හෝ ඔහු විසින් විනිමය පාලන පනත යටතේ ඉදිරිපත් කරන ලද යම් වාර වාර්තාවක හෙළි කර නොමැති, 2(1) (අ) වගන්තියෙහි සඳහන් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කරන ලද සම්පූර්ණ අදාළ විදේශ ව්‍යවහාර මුදලට හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන්, විනිමය පාලන පනත.

මේ පනතේ ඉහතින් වූ විධිවිධාන, කලින් කරන ලද යම් තක්සේරුවක් ප්‍රතිශෝධනය කිරීමට බලය දෙන විධිවිධාන ලෙස තේරුම් ගනු නොලැබිය යුතු බව.

**4.** මේ පනතේ ඉහතින් වූ විධිවිධානවල ඇතුළත් කිසිවකින්—

(අ) (i) ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත වූ අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත වූ අධිභාරය පැනවීමට අදාළ නත් කාලයෙහි නීතියේ ; හෝ

(ii) 1963 අංක 11 දරන මුදල් පනතෙහි හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ

විධිවිධාන යටතේ කරන ලද, එවැනි යම් නීතියක් හෝ පනතක් යටතේ අවසානාත්මකව හා තීරණාත්මකව ඇති, යම් තක්සේරුවක් ;

(ආ) මේ පනත අදාළ වන යම් තැනැත්තකු වෙත, ඔහු විසින් විනිමය පාලන පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමට අදාළව, 1991 නොවැම්බර් මස 12 වන දිනට පෙර පනවන ලද, එවැනි යම් නීතියක් යටතේ අවසානාත්මකව හා තීරණාත්මකව ඇති, යම් නියමයක් ; හෝ

(ඇ) එවැනි යම් නීතියක් යටතේ අවසානාත්මකව හා තීරණාත්මකව ඇති වෙනත් යම් කාරණයක්

ප්‍රතිශෝධනය කිරීමට බලය ලැබෙන්නේ යයි කියවා තේරුම් ගනු නොලැබිය යුතු ය.

රහස්‍යභාවය රැකීම.

**5.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ යම් වාණිජ බැංකුවක හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ සෑම නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් ම, මේ පනත පරිපාලනය කිරීමෙහි ලා තමන්ට දැනගන්නට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය රැකීම හා රහස්‍යභාවය රැකීමෙහිලා ආධාර කිරීම කළ යුතු අතර, 2 (1) (අ) වගන්තියේ සඳහන් විදේශ ව්‍යවහාර මුදල් පිළිබඳ සවිස්තර වූ හෝ තොරතුරක්, යම් පුද්ගලයකුට, සංස්ථාවකට, බැංකුවකට, අධිකරණයකට, ආයතනයකට, අස්තිත්වයකට, දෙපාර්තමේන්තුවකට, නිලධරයකුට, අනුයෝජිතයකුට, ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජිතයකුට හෝ වෙනත් යම් නෛතික හෝ ස්වාභාවික තැනැත්තකුට දීම, හෙළි කිරීම හෝ අනාවරණය කිරීම, නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ පනත පරිපාලනය කිරීමෙහි ලා තමන්ට දැනගන්නට ලැබෙන යම් කාරණයක් හෝ තොරතුරක් දැක්වෙන ලෙස කොමසාරිස් ජනරාල්වරයාට හෝ විනිමය පාලකවරයාට හෝ වාණිජ බැංකුවක නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට—

(i) ඒ කාරණය හෝ තොරතුර අදාළ වන තැනැත්තා විසින් ;

(ii) යම් අධිකරණයක, විෂ මත් ද්‍රව්‍ය හෝ පැහැර ගෙන යාම හෝ පිළිබඳ වූ ජාත්‍යන්තර සම්මුතියක් ක්‍රියාවේ යෙදවීමේ යම් නීතියක් යටතේ පවරනු ලැබ ඇති යම් අපරාධ නඩු කටයුත්තක දී ඒ නීතියෙහි යම් විධිවිධානයක් මගින් ;

(iii) 2 (1) (ආ) වගන්තියේ සඳහන් යම් ගිණුමක ඇති මුදල්, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ වරදක් සමන්විත කරන යම් ක්‍රියාවක් තවදුරටත් කරගෙන යාම පිණිස, යොදා ගෙන ඇති බවට හා දැනටත් යොදා ගන්නා බවට වූ හේතුව මත, ඒ සඳහා වූ ඉල්ලීමක් පිට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලබන ඉල්ලීමක් මගින් ; හෝ

(iv) 2 (1) (ආ) වගන්තියේ සඳහන් ගිණුමක් දරන තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරුද්ධව වාණිජ බැංකුවක් විසින් හෝ ඊට විරුද්ධව, ඒ ගිණුමෙන් පැන නගින බැංකු ගනුදෙනුවකට අදාළව, පවරන ලද යම් නඩු කටයුත්තක දී අධිකරණයේ ආඥාවක් මගින්,

නියම කරනු ලබන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා හෝ විනිමය පාලකවරයා විසින් හෝ වාණිජ බැංකුවේ ඒ නිලධරයා හෝ සේවා නියුක්තයා විසින්, ඒ කාරණය හෝ තොරතුර ඒ තැනැත්තා හෝ අධිකරණය වෙත දන්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරන, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ යම් වාණිජ බැංකුවක යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු, මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"වාණිජ බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් අදහස් වේ ;

"කොමසාරිස් ජනරාල්වරයා", "විදේශ ව්‍යවහාර මුදල්", "ශුද්ධ ධනය", "ලාභ සහ ආදායම" "තක්සේරු වර්ෂය" යන යෙදුම්වලට 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතෙහි ඒවාට පිළිවෙළින් දී ඇති අර්ථම ඇත්තේ ය;

"විනිමය පාලකවරයා" යන්නෙන් මුදල් නීති පනත යටතේ පත් කරන ලද විනිමය පාලකවරයා අදහස් වේ;

"නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් පහත දැක්වෙන විදේශ ව්‍යවහාර මුදල් කිසිවක්, එනම්, එක්සත් ජනපද ඩොලරය, ස්ටර්ලිං පවුම, ඩොයිෂ් මාක්, ස්විස් ෆ්‍රෑන්ක්, ජපාන යෙන්, ඕස්ට්‍රේලියානු ඩොලරය, සිංගප්පූරු ඩොලරය, ප්‍රංශ ෆ්‍රෑන්ක්, කැනේඩියානු ඩොලරය, ඩෙනිෂ් ක්‍රොනර්, නෙදර්ලන්ත ගිල්ඩර්, ස්විඩිෂ් ක්‍රෝනර් සහ හොංකොං ඩොලරය අදහස් වන අතර, විනිමය පාලකවරයා විසින් ලියවිල්ලක් මගින් අනුමත කරන ලද වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලක් ඊට ඇතුළත් වේ;

"විදේශ විනිමය පනත" යන්නෙන් (423 වන අධිකාරය වූ) විදේශ විනිමය පනත අදහස් වේ;

"විදේශ ව්‍යවහාර මුදල් ගිණුම" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සාදන ලද රීතිවලට අනුකූලව විවෘත කරන ලද ශ්‍රී ලංකාවේ යම් වාණිජ බැංකුවක දේශීය බැංකු ඒකකයෙහි වූ ගිණුමක් අදහස් වන නමුත්, වාණිජ බැංකුවක විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයේ විවෘත කරන ලද ගිණුමක් එයට ඇතුළත් නොවේ;

"තැනැත්තා" යන්නට සමාගමක්, පුද්ගල මණ්ඩලයක් හෝ හවුල් ව්‍යාපාරයක් ඇතුළත් වේ;

"අදාළ විදේශ ව්‍යවහාර මුදල්" යන්න, යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී 1991 නොවැම්බර් මස 12 වන දින දරන ලද විදේශ ව්‍යවහාර මුදල් හෝ ඒ තැනැත්තා විසින් 1991 නොවැම්බර් මස 12 වන දින ශ්‍රී ලංකාවෙන් පිටත දී දරන ලද චංචල හෝ නිශ්චල දේපළ කිසිවක් පරිවර්තනය කරනු ලැබූ සහ—

(අ) (i) 1991 නොවැම්බර් මස 12 වන දිනට පෙර අවසාන වන යම් කාලපරිච්ඡේදයක් ඇතුළත ඒ තැනැත්තාට ව්‍යුත්පන්න වූ හෝ පැන නැගුණු හෝ උපචිත වූ ද;

(ii) ආදායම් බදු පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ ඔහු විසින් ඒ සම්බන්ධයෙන් වාර්තාවක් සපයා නොමැත්තා වූ හෝ ඔහු විසින් සපයන ලද යම් වාර්තාවක අනාවරණය කර නොමැත්තා වූ හෝ ආදායම් බදු සඳහා තක්සේරු කරනු නොලැබුවා වූ ද;

(iii) ආදායම් බදු පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ ආදායම් බද්ද අය කිරීමට යටත් වූ ද

ලාභ සහ ආදායම් වන හෝ ඒ ලාභ සහ ආදායමට ආරෝපණය කළ හැකි,

එසේමුත්,—

(අ) විනිමය පාලකවරයා විසින් නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් යටතේ ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් යවන ලද යම් අපනයන සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ලැබිය යුතු යම් මුදලක් ;

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත ඔහු විසින් සල සන ලද යම් සේවා සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ලැබිය යුතු සහ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ හෝ විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ සපයන ලද වාර වාර්තාවක ප්‍රකාශ කර ඇති යම් මුදලක් ;

(ඇ) යම් ණයක් අයකර ගැනීම සඳහා හෝ යම් සිවිල් වග කීමක් බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර යම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ ඊට ආඥාවක් මත විදේශ ව්‍යවහාර මුදලින් අයවිය යුතු යම් මුදලක්

ඇතුළත් නොවන ;

(ආ) ලාභ සහ ආදායම නොවන සහ ලාභ සහ ආදායමට ආරෝප ණය කළ හැකි නොවන ත්‍යාගයක්, ප්‍රදානයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ උරුම්වීමක් මගින් හෝ අන්‍යාකාරයෙන් ඔහු විසින් අත්කර ගන්නා ලද හා විනි මය පාලන පනත යටතේ ඔහු විසින් වාර වාර්තාවක් සපයා නොමැති හෝ අනාවරණය කර නොමැති දේපළට ආරෝපණය කළ හැකි

විදේශ ව්‍යවහාර මුදල් ඉන් අදහස් වේ.

"ආදායම් බද්ද පැනවීමට අදාළ තත්කාලයෙහි නීතිය" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ ;

"ආදායම් බද්ද මත අධිභාරය පැනවීමට අදාළ තත්කාලයෙහි නීතිය" යන්නෙන් 1982 අංක 26 දරන ආදායම් බදු අධි භාර පනත, 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාර පනත සහ 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත අදහස් වේ ;

"ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාර පැනවීමට අදාළ තත් කාලයෙහි නීතිය" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත, 1982 අංක 25 දරන ධන බදු අධිභාර පනත සහ 1989 අංක 8 දරන ධන බදු අධිභාර පනත අදහස් වේ;

"පිරිවැටුම" හා "කාර්තුව" යන යෙදුම්වල 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතෙහි ඒවාට පිළිවෙළින් දී ඇති අර්ථයම ඇත්තේ ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.